www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### නික් බීම්ස් 70 වන සංවත්සර රැස්වීම අමතයි

# ධනවාදී බිඳවැටීම සහ හතර වන ජාත්‍යන්තරයේ විප්ලවවාදී ඉදිරිදර්ශනය

### 4 වන කොටස

**Nick Beams addresses 70th anniversary meeting**
**Capitalist breakdown and the revolutionary perspective of the Fourth International**
**Part 4**

**නික් බීමස් විසිනි**
**2008 ඔක්තෝබර් 8**

*පහත පලවන්නේ හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ 70 වන සංවත්සරය වෙනුවෙන් සැප්තැම්බර් 28 දා සිඩ්නි නුවර පැවති ප්‍රසිද්ධ රැස්වීමකට නික් බීම්ස් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක අවසාන කොටසයි. බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු මෙන් ම ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ද වේ.*

වත්මන් අර්බුදය, කම්කරු පන්තිය දැන් මුහුන දෙමින් සිටින අතිමූලික දේශපාලන ප්‍රශ්න වෙත තියුනු ලෙස අවධානය යොමු කරයි. මනුෂ්‍ය වර්ගයාගේ සමස්ත සංස්කෘතියට ම දැන් තර්ජනය එල්ල කරන ව්‍යසනය -- ආර්ථික අවුල්වියවුල්, යුද තර්ජනය සහ ස්වභාවික පරිසරයේ ගැඹුරු වන අර්බුදයක් -- වලකා ගැනීමට සමත් වන, ලෝක මහජනතාවගේ අවශ්‍යතා නියෝජනය කරන, සැලසුම කුමක් ද, වැඩපිළිවෙල කුමක් ද? එය ක්‍රියාවට දැමීමේ අරගලය මෙහෙයවනු වස් ගොඩනැගිය යුත්තේ කුමන ආකාරයක දේශපාලන පක්ෂයක් ද? මේවා අද දිනයේ දැවෙන ප්‍රශ්න ය.

1938 දී හතර වන ජාත්‍යන්තරයේ ඉදිරිදර්ශනය විස්තාරනය කිරීමේ දී, ට්‍රොට්ස්කි පැහැදිලි කලේ. එහි ස්වභාවය ද එහි ඓතිහාසික කර්තව්‍යයන් ද සමග ගැලපෙන පරිදි, එය සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය ලෙස හැඳින්විය යුතු බව යි. 1914 දී පලමු වන ලෝක යුද්ධය පැන නැඟීම, ජාතික ක්‍රියාමාර්ගවල හා ඉදිරිදර්ශනවල ශක්‍යතාවට සඳහට ම අවසන් තිත තබා තිබුනි.

ඔහු පැහැදිලි කල පරිදි, ලෝක පක්ෂය, ක්‍රියාමාර්ගයක්, එනම්, එහි සාරභූත කර්තව්‍යයන් විස්තාරනය කරන, එකිනෙක හා සමීපව බැඳුනු අදහස් පද්ධතියක්, දේහානුරූප කරයි. ක්‍රියාමාර්ගයක් යනු හුදු ක්ෂනික පිලිවෙත් හා ඉල්ලීම් මාලාවක් නොව, ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඓතිහාසික හා මූලෝපායික අත්දැකීම් පිලිබඳ තක්සේරුවක් මත පදනම් කෙරුනු එකකි. විප්ලවවාදී නායකත්වයක් අධ්‍යාපන ගත කිරීම හා පුහුනු කිරීම කල හැක්කේ එවන් සංකල්පයක පදනම මත ම පමනි. ක්‍රියාමාර්ගය නිර්මානය කරනු ලබන්නේ පක්ෂය විසින් නොව, ඒ වෙනුවට පක්ෂය නිර්මානය කරනු ලබන්නේ ක්‍රියාමාර්ගය මගින් බව, ඔහු අවධාරනය කලේ ය.

එකල විවිධාකාර මාධ්‍යමික ප්‍රවනතා හා සංවිධාන සියල්ල මෙම සංකල්පයට විරුද්ධ විය. ඔවුන්ගෙන් බොහොමයක් හතර වන ජාත්‍යන්තරයේ ශාඛාවන්ට වඩා විශාල වූ අතර ඔවුන් කියාපෑවේ ඉතිහාසයේ පාඩම් උකහා ගැනීම හා මූලධර්ම මත කෙරෙන මෙම අවධාරනය ආධානග්‍රාහී හා කට්ටිවාදී බව යි. අවශ්‍ය වී ඇත්තේ, නව හා පුලුල් පදනමක් සහිත සංවිධානයක් නිර්මානය කරනු පිනිස සියලු විපාර්ශ්වික ප්‍රවනතා හා කන්ඩායම් එකට ඒකාබද්ධ කිරීම යි. එහෙත් එලඹුනු සිද්ධීන් තුල සනාථ වී ඇත්තේ ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය යි. මෙම සෙසු පක්ෂවලින් එකක් වත් දෙවන ලෝක යුද්ධයෙන් පසුව පැවතුනේ නැත.

පශ්චාත්-යුද කාල පරිච්ඡේදය හතර වන ජාත්‍යන්තරයට නව ගැටලු හා අභියෝග මතු කලේ ය. ස්ටැලින්වාදී පක්ෂවල පාවාදීම් නිසා සිදු කල හැකි වූ, ධනේශ්වර දේශපාලන පර්යායේ යලි ස්ථායිකරනය, ඉන් පසුව සිදු වූ ආර්ථික පුනර්ජීවනය සමග එක්ව ගත් කල, හතර වන ජාත්‍යන්තරය පදනම් කෙරී තිබුනු ඉදිරිදර්ශනය අවලංගු කර ඇති බවක් පෙනී ගියේ ය. තව දුරටත් ගත් කල, නැගෙනහිර යුරෝපය තුල ස්ටැලින්වාදී නිලධරයේ ජයග්‍රහන සහ චීන හා යුගෝස්ලාවියානු විප්ලවවල ජයග්‍රහන, සමාජවාදය සාක්ෂාත් කර ගත හැක්කේ කම්කරු පන්තියේ නව ජාත්‍යන්තර විප්ලවවාදී නායකත්වය ලෙස හතර වන ජාත්‍යන්තරය ගොඩනැගීම හරහා ම පමනකි යන න්‍යාය බිඳ හෙලා ඇති බවක් ද පෙනී ගියේ ය.

නව තත්වය හතර වන ජාත්‍යන්තරය තුල අති මහත් දේශපාලන පීඩනයන් නිර්මානය කලේ ය. මෙම පීඩනයන් සංශෝධනවාදී න්‍යායන්ගේ වර්ධනය තුල සිය ප්‍රකාශනය අත්පත් කර ගැනීමට නියමිත විය. විවිධාකාර රූපාකාරයන්ගෙන්, එම න්‍යායන් කියා සිටියේ, ස්ටැලින්වාදී හා ලේබර් නිලධරයන්, සුලු ධනේශ්වර හා ධනේශ්වර ජාතිකවාදී නායකත්වයන් සමග එක්ව ගත් කල, සමාජවාදයේ ජයග්‍රහනයට බාධක බවට පත්වනවා නොව, මහජන පීඩනය යටතේ, ඔවුන් සමාජවාදය සාක්ෂාත් කිරීමේ වාහක බවට යථා වසයෙන් ම පත් විය හැකි බව යි. හතර වන ජාත්‍යන්තරයේ ප්‍රමුඛතම පශ්චාත්-යුද කාලීන යුරෝපීය නායකයන් දෙදෙනා වන මයිකල් පැබ්ලෝ සහ අර්නස්ට් මැන්ඩෙල් විසින් මෙම සංශෝධනවාදී ඉදිරිදර්ශන ඉදිරිපත් කරනු ලැබීම ඇරඹුනි.

"අප යමින් සිටින්නේ කොහිද?" යන මැයෙන් 1951 දී නිකුත් කෙරුනු ලියවිල්ලක් තුල පැබ්ලෝ මෙසේ ලිවී ය: "අපගේ ව්‍යාපාරය සඳහා වෛෂයික සමාජ යථාර්තය සමන්විත වන්නේ අත්‍යවශ්‍යයෙන් ම ධනපති තන්ත්‍රයෙන් හා ස්ටැලින්වාදී ලෝකයෙනි. තව දුරටත් කිය තොත්, අප එයට කැමති වුවත් නැතත්, ධනවාදයට විරුද්ධ වන බලවේගවලින් අතිමහත් බහුතරයක් මේ දැන් සිටින්නේ සෝවියට් නිලධරයේ නායකත්වය හෝ ආනුභාවය යටතේ වන බැවින්, සමස්තයක් ලෙස මෙම අංග දෙකෙන් වෛෂයික සමාජ යථාර්ථය සමන්විත වෙයි."

පශ්චාත්-යුද කාලීන සංශෝධනවාදී දෘෂ්ටියේ හදවත බවට පත් වීමට නියමිතව තිබුනු ධාරනාවාදී විධික්‍රමය මෙම ඡේදය මගින් සාරාංශගත කෙරෙයි. එක පැතකින් ද එක්සත් ජනපදය හා එහි සගයන් ද අනෙක් පැත්තෙන් සෝවියට් නිලධරය හා සෙසු අය ද අතර ලෝකය සරල ලෙස බෙදන ලදි. කම්කරු පන්තියට ඉටු කිරීමට කිසිදු ස්වාධීන කාර්යභාරයක් තිබුනේ නැත. එහි ප්‍රතිවිපාකයක් ලෙස හතර වන ජාත්‍යන්තරයට ද ඉටු කිරීමට කිසිදු ස්වාධීන කාර්යභාරයක් තිබුනේ නැත. එම කාර්යභාරය කම්කරු පන්තිය මත ආධිපත්‍යය දැරූ සුවිශාල නිලධරයන් මත ක්‍රියා කරන යම් ආකාරයක බලපෑම් කන්ඩායමකට ලඝු කෙරුනි.

1951 පැවති හතර වන ජාත්‍යන්තරයේ තුන් වන සම්මේලනයේ දී, පැබ්ලෝ සිය නව දෘෂ්ටිවාදයේ ඇඟවුම් ප්‍රකාශයට පත් කලේ ය. හතර වන ජාත්‍යන්තරයේ ස්වාධීනත්වය පිලිබඳ සියලු ප්‍රශ්න සෑම රටක් තුල ම "මහජන ව්‍යාපාරය තුලට යථා ලෙස ඒකාග්‍රවීමට" යටත් කිරීම අවශ්‍ය යයි ඔහු තර්ක කලේ ය.

මෙයින් අදහස් කෙරුනේ හතර වන ජාත්‍යන්තරය දියකර හැරීමට නොඅඩු දෙයකි. හතර වන ජාත්‍යන්තරය වෙත විවෘත ලිපිය නිකුත් කිරීම කරා, ඇමරිකානු ට්‍රොට්ස්කිවාදී පක්ෂය වන සමාජවාදී කම්කරු පක්ෂයේ (සකප) නායක ජේම්ස් පී. කැනන්, මෙහෙයවූයේ මෙම ඉදිරිදර්ශනය යි. 1953 දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පිහිටුවීම කරා මෙහෙයවූයේ, 1938 දී හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ දී පාදක කෙරී තිබූ ප්‍රධාන මූලධර්ම යලි තහවුරු කල, මෙම විවෘත ලිපිය යි.

1954 දී ලියන ලද ලිපියක් තුල, කැනන්, භේදය තුල මතුව තිබූ ගැටලු සාරාංශගත කලේ ය. විප්ලවවාදී පක්ෂය පිලිබඳ ලෙනින්-ට්‍රොට්ස්කි න්‍යාය සහ විප්ලවවාදී අරගලයේ නායකයා ලෙස එහි කාර්යභාරය, වත්මන් යුගයේ දී අන් සියල්ලට ම ඉහලින් ආධිපත්‍යය දරන බව ඔහු එහි දී අවධාරනය කලේ ය. සමාජවාදී පරිවර්තනය කිසියම් ආකාරයකින් අර්ධ-ස්වයංක්‍රීය ස්වරූපයකින් සිදු කල හැකි ය යන අදහස දැරීම මාක්ස්වාදය මුලුමනින් ම අතහැරීමක් විය.

"නැත, එය දැනුවත් ක්‍රියාවක් ම පමනි. එය අවශ්‍යයෙන් ම ඉල්ලා සිටින්නේ, ඓතිහාසික ක්‍රියාදාමය තුල දැනුවත් සාධකය නියෝජනය කරන මාක්ස්වාදී පක්ෂයේ නායකත්වය යි. වෙනත් කිසිදු පක්ෂයක් එය සිදු නොකරනු ඇත. කම්කරු ව්‍යාපාරය තුල සිටින වෙනත් කිසිදු ප්‍රවනතාවක් සතුටුදායක ආදේශකයක් ලෙස සැලකිය නොහැකි ය. එම හේතුව නිසා ම, සෙසු සියලු පක්ෂ පිලිබඳ අපගේ ආකල්පය අසමනීය ලෙස සතුරු ය."

## හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව

1953 දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පිහිටුවීම, හතර වන ජාත්‍යන්තරය තුල අවස්ථාවාදයට එරෙහි දිග්ගැසුනු අරගලයක් බවට පත් වීමට නියමිතව තිබූ ක්‍රියාදාමයක ආරම්භය සනිටුහන් කලේ ය. 1963 දී සකප පැබ්ලෝවාදීන් සමග යලි එකමුතුවීමක් කරා ගමන් කලේ, ඊට දශකයකට පෙර ව්‍යාපාරය භේද වීමට තුඩු දුන් ගැටලු විසඳී ඇත යන පදනම මත ය. යලි එකමුතුවීම පදනම් කෙරුනේ කියුබාවේ සිද්ධීන් පිලිබඳ පොදු තක්සේරුවක් මත ය -- එනම්, කැස්ට්‍රෝගේ සුලු ධනේශ්වර ජාතිකවාදී ව්‍යාපාරය කම්කරු රාජ්‍යයක් ගොඩනගා ඇති බවත් කැස්ට්‍රෝ ම "නොදැනුවත් මාක්ස්වාදියකු" බවට පත්ව ඇති බවත් ය. වෙනස් රූපාකාරයකින් වුවත්, 1953 සියලු ගැටලු යලි මතු කෙරුනි. කැස්ට්‍රෝ විසින් මෙහෙයවනු ලබන සුලු ධනේශ්වර ජාතිකවාදී බලවේගවල නායකත්වය යටතේ කියුබාව තුල සමාජවාදය සාක්ෂාත් කල හැකි නම්, එවිට හතර වන ජාත්‍යන්තරය සඳහා පවතින අවශ්‍යතාව කුමක්ද?

එපමනක් නොව, ලියොන් ට්‍රොට්ස්කිගේ ඝාතකයා වූ රේමන් මර්කාඩර් මෙක්සිකෝවේ සිර දඬුවමෙන් නිදහස්

වූ පසු කියුබාවට පැමිනි කල, සියලු මධ්‍යම පන්තික රැඩිකල් කන්ඩායම් සඳහා විප්ලවවාදී අරගලයේ මූර්තිය වූ චේ ගුවේරා, ඔහුව උනුසුම් ලෙස පිලිගත්තේ ය යන කරුන මගින්, කියුබානු තන්ත්‍රයේ ස්වරූපය සංකේතවත් කෙරුනි.

සකප දියකරහැරීම්වාදී ඉදිරිදර්ශනය ප්‍රතික්ෂේප කිරීමට නායකත්වය දෙනු ලැබුවේ, පැබ්ලෝවාදයට එරෙහි අරගලය ගැඹුරු කල, හීලි බන්ඩා හා ස්ලෝටර් යන බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන් විසිනි. පැබ්ලෝවාදී ව්‍යාපාරයේ ශ්‍රී ලංකා ශාඛාව වූ ලංකා සමසමාජ පක්ෂය (ලසසප) 1964 දී බන්ඩාරනායක මැතිනියගේ ධනේශ්වර සභාග ආන්ඩුවට ඇතුලු වූ විට. බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන්ගේ ආස්ථානය සනාථ විය.

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ බ්‍රිතාන්‍ය ශාඛාව වූ කම්කරු විප්ලවවාදී පක්ෂයේ (කවිප) ජාතික අවස්ථාවාදී පරිහානිය විසින් නිර්මානය කෙරුනු 1985-86 ජාත්‍යන්තර කමිටුවේ භේදය තුල, පැබ්ලෝවාදයට එරෙහි අරගලය තුල මතු වූ සියලු ඓතිහාසික හා න්‍යායික ගැටලු පැන නැගීමට නියමිත විය.

අඛන්ඩව වැඩුනු කවිපයේ අවස්ථාවාදී ගමන, විශේෂයෙන් ම මැද පෙරදිග සුලු ධනේශ්වර ජාතිකවාදී ව්‍යාපාරවලට සම්බන්ධිත එහි අවස්ථාවාදී ගමන, අරබයා කවිප දේශපාලන පිලිවෙත සමග පවත්නා මතභේද 1982 දී වර්කර්ස් ලීගය විසින් මතු කරනු ලැබ තිබුනි. හීලි-බන්ඩා-ස්ලෝටර් නායකත්වය විසින් මෙම විවේචන යට ගසනු ලැබී ය.

එහෙත් 1985 දී, කවිප අවස්ථාවාදය පක්ෂය තුල පිපිරීමකට තුඩු දුන් කල, වර්කර්ස් ලීගයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත්ගේ විවේචන, ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවල බහුතරයක ද කවිප තුල ම ප්‍රවනතාවක ද සහයෝගය දිනා ගැනීමට සමත් විය.

භේදයේ ක්‍රියාදාමය තුල දී, ජෙරී හීලි ට්‍රොට්ස්කිවාදයේ සියලු අවස්ථාවාදී විරුද්ධවාදීන්ගේ දෘෂ්ටිය සාරාංශගත කලේ ය. "පිරිසිදුව ජලයෙන් හා කුඩාම සංඛ්‍යාවන්ගෙන් යුක්ත හා සුදු පැහැයටත් වඩා සුදු සමාජවාදයක් සොයන්නේ යයි ඔහු ජාත්‍යන්තර කමිටුව හෙලාදැක්කේ ය. වෙනත් වචනවලින් කියතොත්, මූලධර්මවලට, ට්‍රොට්ස්කිවාදී ක්‍රියාමාර්ගයට බැඳී සිටීම ගෙන එනු ඇත්තේ හුදකලාව ම පමනි. ඔහුට පෙර සිටි පැබ්ලෝ සහ "යථා මහජන ව්‍යාපාරය" තුලට හතර වන ජාත්‍යන්තරය ඒකාග්‍ර කරන ලෙස පැබ්ලෝ කල කැඳවුම මෙන් ම, හීලිගේ ද ජාත්‍යන්තර කමිටුවෙන් භේද වූ විවිධාකාර ප්‍රවනතාවන්ගේ ද යොමුව පැවතියේ ස්ටැලින්වාදී නිලධරය දෙසට ය.

කවිප අවස්ථාවාදීන්ට එරෙහි අරගලය, පශ්චාත්-යුද කාල පරිච්ඡේදය තුල ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය විසින් ගෙන යනු ලැබූ දිග්ගැසුනු හා අසීරු අරගලයේ හැරුම් ලක්ෂ්‍යයක් සලකුනු කලේ ය.

පශ්චාත්-යුද කාල පරිච්ඡේදය මුලුල්ලේ හතර වන ජාත්‍යන්තරයට පහර දුන් සියලු අවස්ථාවාදී ප්‍රවනතා, තම ශක්තිය උකහා ගෙන තිබුනේ, අවසාන විග්‍රහයේ දී, කම්කරු පන්තිය මත ස්ටැලින්වාදී නිලධරයන්ට පැවති ආධිපත්‍යය වෙතිනි. එහෙත් 1985-86 දී, ලෝක ආර්ථිකයේ සිදු වෙමින් පැවති අතිමහත් වෙනස්කම් ගෝලීය දේශපාලන ව්‍යුහය කඩාබිඳ දැමීමේ ක්‍රියාදාමයක නිමග්නව සිටියේ ය. අවස්ථාවාදීන් පාදක වී ගත් ස්ටැලින්වාදී නිලධරයෝ කඩාවැටීමට නියමිත වූහ.

## දැවැන්ත පරිවර්තනයක්

අවසාන විග්‍රහයේ දී, කවිපයේ අර්බුදය, ලෝක ආර්ථිකයේ දැවැන්ත වෙනස්කම්වල -- ජාතිකවාදී ඉදිරිදර්ශනයක් මත පාදක වී ගත් එම සියලු පක්ෂවල හා සංවිධානවල කුනුවීමක් හා බිඳවිසිරීමක් අත්දැක ඇති නිෂ්පාදනයේ භූගෝලීයකරනයේ -- ප්‍රතිඵලයක් විය.

එපමනක් නොව, කවිප ජාතික අවස්ථාවාදීන්ට එරෙහිව 1985-86 දී ජාත්‍යන්තර කමිටුව ලද ජයග්‍රහනය, ඓතිහාසික දේශපාලන චලනයක පෙරනිමිත්තක් විය. නිෂ්පාදනයේ භූගෝලීයකරනය, ලෝක ආර්ථිකයේ ඒකාග්‍රකරනය සහ අන් සියල්ලට මත් වඩා, ජාත්‍යන්තර කම්කරු පන්තියේ ඒකාග්‍රකරනය, අද, හතර වන ජාත්‍යන්තරයේ ඉදිරිදර්ශනය -- සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය ගොඩනැගීම -- සාක්ෂාත් කර ගැනීම සඳහා වෛෂයික කොන්දේසි නිර්මානය කර ඇත.

ජේම්ස් පී. කැනන් වෙත යැවූ ලිපියක ට්‍රොට්ස්කි වරක් මෙසේ ලිවී යඃ "ප්‍රමානවත් නොවන සංඛ්‍යාත්මක බලවේග හා ද්‍රව්‍යමය මාධ්‍ය සහිතව, අප වැඩ කරන්නේ ලෝකයේ පවතින වඩාත් ම නිවැරදි හා බලගතු අදහස් සමග ය. එහෙත් දිගු කාලීනව ගත් කල, නිවැරදි අදහස්, නිරතුරුව ම ජයගෙන ඒවා සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය මාධ්‍යයන් හා බලවේග නිර්මානය කර ගනී." ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය දැන් සනාථ වෙමින් තිබේ.

මතු පිටින් ගත් කල, සෝවියට් සංගමයේ බිඳවැටීමෙන් අනතුරුව පැවති පසුගිය වසර 20ක කාල පරිච්ඡේදය අසීරු එකක් වී තිබේ. මිලියන සංඛ්‍යාත ජනතාවට පෙනී ගියේ සමාජවාදය පිලිබඳ ඉදිරිදර්ශනය එහි වලංගු භාවය මුලුමනින් ම අහිමි කර ගෙන ඇති බවකි. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ බිඳවිසිරීම, සමාජවාදයේ අවසානය නියෝජනය කරනවා නොව,

ස්ටැලින්වාදී නිලධරය විසින් ඔක්තෝබර් විප්ලවය පාවා දෙනු ලැබීමේ දශක ගනනාවක ක්‍රියාදාමයේ අවසන් ප්‍රතිඵලය බව අවබෝධ කර ගැනීමට ඔවුහු අපොහොසත් වූහ. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ බිඳවැටීම වනාහි, ප්‍රමාද වී නොව ඉක්මනින් ම, ලෝක ධනවාදයේ ද පශ්චාත්-යුද කාලීන දේශපාලන පර්යායේ ද පදනම් බිඳ දමනු ඇති සමාජ-ආර්ථික ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලය ය යන ජාත්‍යන්තර කමිටුවේ විශ්ලේෂනය, නිවැරදි බවක් නොපෙනුනි. සත්තකින් ම නිවැරදි බවක් පෙනී ගියේ එහි ප්‍රතිවිරුද්ධය යි. එනම්, ධනවාදය නව ජීවන කාලයක් ලබා ගෙන ඇති බවකි. සමහරුන්ට අනුව, එය ඉතිහාසයේ අවසානය පවා විය.

එහෙත් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ විශ්ලේෂනය දැන් සිදු වෙමින් පවතින ලෝක ධනවාදී පර්යායේ බිඳවැටීම තුල සනාථ වී ඇත. එය වනාහි ලෝක සමාජවාදයේ ඉදිරිදර්ශනය යලිත් ඓතිහාසික න්‍යාය පත්‍රය මත ඉතා නිශ්චිතව ම තබා ඇති බිඳවැටීමකි.

සංශෝධනවාදයේ හා අවස්ථාවාදයේ සියලු රූපාකාරයන්ට එරෙහිව ට්‍රොට්ස්කිවාදී ක්‍රියාමාර්ගය ආරක්ෂා කිරීමට හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් වසර 50කට වැඩි කාලයක් තිස්සේ ගෙන යනු ලැබූ අරගලයේ තීරනාත්මක වැදගත්කම මෙම වර්ධනයන් මගින් අවධාරනය කෙරෙයි.

1903 දී, සමාජවාදී ව්‍යාපාරයේ බොහෝ දෙනෙකු විසින් බෝල්ෂෙවික්වරුන් හා මෙන්ෂෙවික්වරුන් අතර භේදය සලකනු ලැබුවේ රුසියාවේ විප්ලවවාදී ව්‍යාපාරයේ අපරිනත භාවයේ ප්‍රතිඵලයක් ලෙස ය, නැත හොත් එය එම "කලහකාරී රුසියානුවන්ට" සරලව ම බැර කෙරුනි. එහෙත් 1917 දී, බෝල්ෂෙවික්වරුන්ගේ නායකත්වය යටතේ, ඔක්තෝබර් විප්ලවයේ දී, පෙරලා දමන ලද ධනේශ්වර ආන්ඩුවේ ප්‍රධාන දේශපාලන මුක්කුව බවට පත්වූයේ මෙන්ෂෙවික්වරු ය.

අප යලිත් වතාවක් ඇතුලු වෙමින් සිටින්නේ, ඉතිහාසයේ එවන් කාල පරිච්ඡේදයකට ය. අවස්ථාවාදයට එරෙහිව විප්ලවවාදී ව්‍යාපාරය විසින් ගෙන යනු ලබන අරගලය, කම්කරු පන්තියේ අරගලවල වර්ධනය තුල තීරනාත්මක වැදගත්කමක් අත්පත් කර ගැනීමට යන අතර මාක්ස්වාදය හා අවස්ථාවාදය අතර ගැටුම විප්ලවය හෝ ප්‍රතිවිප්ලවය යන දෙකෙන් එකක් තෝරා ගැනීම පිනිස බව මිලියන සංඛ්‍යාත ජනයාට පැහැදිලි වනු ඇත.

පන්ති අරගලය නිරතුරුව ම අවසානයක් කරා ගෙන යනු ලැබෙන රටක් ලෙස කියනු ලැබ ඇති ප්‍රන්සයේ වර්ධනයන් වෙත ඔබගේ අවධානය යොමු කිරීමට මට ඉඩ දෙන්න.

එහි පැබ්ලෝවාදී පක්ෂය වන ලීග් කොමියුනිස්ටේ රිවලූෂනරේ (එල්සීආර්), ලබන වසර මුල දී නව ධනපති-විරෝධී පක්ෂයක් (එන්පීඒ) පිහිටුවීමට සූදානම් වේ. පසුගිය මාර්තු මාසයේ දී දුන් සම්මුඛ සාකච්ඡාවක දී, එල්සීආර් නායක ඔලිවර් බෙසන්සෙනොට්, මෙම නව සංවිධානය ගොඩනැගීමට යන විවෘතව ම අවස්ථාවාදී පදනම ප්‍රකාශයට පත් කලේ ය.

"එන්පීඒහි එල්ලය වන්නේ, රැඩිකල් වමේ විවිධාකාර සම්ප්‍රදායන්ගේ ධාරාවන් ඒකාග්‍ර කිරීම යි. මෙම ඒකාග්‍රකරනයේ කොන්දේසියක් ලෙස මෙම සම්ප්‍රදායන්ගේ උරුමය පිලිබඳ විවෘත සාකච්ඡාවක් කල යුතු ද නැත හොත් එය සිදු කල හැක්කේ, භාවිතාව සහ සංයුක්ත අරගලවල අභිසාරිතාව හරහා පමනක් ද. විවිධාකාර දෘෂ්ටිමය හා ඓතිහාසික "උරුමයන්" පිලිබඳ සාකච්ඡාව ආකර්ෂනීය විය හැකි ය. එය නිසැකව ම දීර්ඝ එකක් ද වනු ඇත. එහෙත් අපට එයින් පටන් ගත නොහැකි ය. විශේෂයෙන් ම අරමුන වන්නේ, හරියට ම, පක්ෂ දේශපාලනයට කැපවීම පිලිබඳ දීර්ඝ ඉතිහාසයක් නැති සුවිශේෂව ම මෙම සම්ප්‍රදායන් මොනම එකක් වත් සමග අනන්‍යතාවක් නොමැති මිනිසුන් හා ගැහැනුන් එකට ඒකාබද්ධ කිරීම නිසා වන බැවිනි."

ඉතිහාසය හා මූලධර්ම මෙලෙස ප්‍රතික්ෂේප කිරීමේ දේශපාලන අර්ථය කිසිසේත් ම වරද්දා ගැනීමක් නොවේ. එහි අන්තර්ගතය වන්නේ, ප්‍රන්ස පාලක පන්තියේ ප්‍රධාන මුක්කු වන, 1936 දී, 1944-45 දී හා යලිත් වරක් 1968 දී ප්‍රන්ස ධනවාදය ගලවා ගැනීමෙහි ලා එතරම් ම තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කල, සමාජවාදී පක්ෂය සහ අන් සියල්ලට මත් වඩා කොමියුනිස්ට් පක්ෂය, බිඳවැටී ඇති කොන්දේසි යටතේ, එන්පීඒ එම අඩුව පුරවාලීමට සූදානම්ව සිටින බව, ප්‍රන්ස පාලක පන්තිය වෙත බෙසන්සෙනොට් විසින් කරන ලද ප්‍රකාශයකි. එලඹෙන විප්ලවවාදී අර්බුදයේ දී, ධනපති පර්යාය රැක ගනු වස් එය ධනේශ්වර ආන්ඩුවකට ඇතුලු වනු ඇත.

ධනේශ්වරය පිලිතුරු ද දී තිබේ: පනිවිඩය අවබෝධ කර ගෙන තිබේ. බෙසන්සෙනොට් ප්‍රවෘත්ති හා සාකච්ඡා වැඩසටහන්වල ද දේශපාලන අදහස් පල කරන මන්ඩලවල ආදරවන්තයකු බවට පත්ව ඇත්තේ ඒ නිසා ය.

පනිවිඩය අත්ලාන්තික් සයුර හරහා ද ලබා ගෙන ඇති බව පෙනී යයි. සැප්තැම්බර් 13 දා *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය, පුළුල් සම්මුඛ සාකච්ඡාවක් මත පදනම්ව, බෙසන්සෙනෝ පිලිබඳ ඉතා පක්ෂපාතී විශේෂාංග ලිපියක් පල කලේ ය. එය ඔහු විස්තර කරන්නේ, "දැඩි ප්‍රන්ස වාමාංශයේ වඩාත් ම විශේෂඥ නායකයා, සමාජවාදී පක්ෂයේ කලකිරුනු තරුන සාමාජිකයන්

හා වරක් බලගතු කොමියුනිස්ට්වාදීන්ගේ ඉතිරිපහදු සඳහා මග පෙන්වන ප්‍රදීපස්ථම්බයක්" ලෙස ය. ඉතිං මෙම ප්‍රදීපස්ථම්බය විසින් සපයනු ලබන මග පෙන්වීම කුමක්ද. ලිපියේ ශීර්ෂ පාඨය එය සාරාංශගත කරයිඃ "වමෙන් දල්වා ඇති ආලෝකය ඔහුගේ සහෝදරවරුන්ට ප්‍රන්සයේ ප්‍රධාන ප්‍රවාහය දෙසට මග පෙන්වයි."

මීට වසර හැත්තෑවකට ඉහත දී, හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමට සුභපතමින් ලියොන් ට්‍රොට්ස්කි මෙසේ ලිවී යඃ "අපි අනෙක් පක්ෂ මෙන් පක්ෂයක් නොවෙමු. . . . අපගේ එල්ලය වන්නේ, සමාජවාදී විප්ලවය හරහා වැඩ කරන ජනතාවගේ හා සූරාකෑවෙන්නන්ගේ පූර්න ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික විමුක්තිය යි. කිසිවෙක් එය සූදානම් නොකරනු ඇත. අප ම මිසක් අන් කිසිවෙක් එයට මග නොපෙන්වනු ඇත."

පැරනි පක්ෂ අරටුව දක්වා ම කුනු වී ඇති බව ඔහු තව දුරටත් පැවසී ය. "මනුෂ්‍ය වර්ගයා මත කඩා පාත් වන දැවැන්ත සිද්ධීන්" මෙම යල් පිනූ සංවිධානවල එක ගලක් වත් ඉතිරි නොකර ඒවා බිඳදමනු ඇත." අනාගතය දෙස විශ්වාසයෙන් යුක්තව බලන්නේ හතර වන ජාත්‍යන්තරය පමනි. එය සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය යි. මෙම පෘථිවිය මත ඊට වඩා ශ්‍රේෂ්ඨ කර්තව්‍යයක් කිසිදාක නොවීය. අප සෑම කෙනෙක්ගේ ම උර මත අතිමහත් ඓතිහාසික වගකීම් සම්භාරයක් පවතී."

දැන් දිගහැරෙමින් පවතින සිද්ධීන්ගේ සන්දර්භය තුල, මෙම වචන වඩාත් දැවැන්ත අර්ථභාරයක් අත්පත් කර ගෙන තිබේ.

**සමාප්තයි**

© www.wsws.org